# වෙනත් පත් කිරීම් ආදිය

**1972 අංක 07 දරන ගෙවල්කුලී පනත අනුව බලයලත් නිළධාරී තනතුර පත් කිරීම පිළිබඳ දැනුම් දීමයි**

දකුණු පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, ග්‍රාම සංවර්ධන, ආර්ථික ප්‍රවර්ධන, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, වනිතා කටයුතු, නිවාස හා ඉදිකිරීම් හා මිනිස් බල හා රැකී රක්ෂා අමාත්‍ය වන මා විසින් 1972 අංක 07 දරන ගෙවල් කුලී පනත යටතේ මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන් හි බලයලත් නිලධාරී වශයෙන් ගරුසිංගෙයි කුලසිරි මහතා පත්කර ඇති බැව් මෙයින් දැනුම් දෙන අතර එකී පනත අනුව ඔහුගේ බලතල හා කාර්යයන් පහත දැක්වේ :-

*(අ)* තම පත්වීම් ප්‍රදේශය ඇතුළත කර ඇතැයි කියනු ලබන 1972 අංක 07 දරන ගෙවල් කුලී පනත හා එහි සංශෝධන යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් නඩුවක් පැවරීම ;

*(ආ)* තම පත්වීම් ප්‍රදේශය ඇතුළත පිහිටි යම් ස්ථානයක කුලී නිවැසියාගේ ඉල්ලීම පිට ඒ කුලී නිවැසියාට මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට මේ පනතින් බලය දී ඇති යම් ඉල්ලීමක් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ;

*(ඇ)* තම පත්වීම් ප්‍රදේශය ඇතුළත කර ඇතැයි කියනු ලබන මේ පනතේ යම් කඩ කිරීමක් පිළිබඳව තමා වෙත යම් පැමිණිල්ලක් කරනු ලැබූ විටෙක අවශ්‍ය විය හැකි වූ යම් විභාගයක් කිරීම සහ ඒ විභාගයේ කාර්යයන් සඳහා ඒ ස්ථානය පරීක්ෂා කිරීමේ හෝ ඒ පැමිණිල්ලේ කරුණු පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ කාර්යය පිණිස දහවල් කාලයේ යම් යුක්ති සහගත වේලාවක යම් ස්ථානයකට ඇතුළු වීම ; සහ

*(ඈ)* මේ පනතේ විධිවිධානවලට අනුකූල වීම නිසැක කර ගැනීමට අවශ්‍ය විය හැකි විභාග සාමාන්‍යයෙන් කිරීම හා එසේ අවශ්‍ය විය හැකි පියවර ගැනීම ද, තත් කාර්යය සඳහා පනවනු ලැබූ නියෝගවලට අනුකූලව පරීක්ෂා කිරීමේ හෝ වෙනත් බලතල ක්‍රියාවේ යෙදවීම.

නීතිඥ යූ. ජී. ඩී. ආරියතිලක,
අමාත්‍ය,
ක්‍රීඩා, යෞවන කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, ග්‍රාම සංවර්ධන,
ආර්ථික ප්‍රවර්ධන, සමාජ සුභසාධන, පරිවාස හා
ළමාරක්ෂක සේවා, වනිතා කටයුතු, නිවාස හා
ඉදිකිරීම් සහ මිනිස්බල හා රැකී රක්ෂා අමාත්‍යාංශය,
දකුණු පළාත් සභාව.

2013 මැයි මස 03 වැනි දින,
ක්‍රීඩා, යෞවන කටයුතු,
ග්‍රාමීය කර්මාන්ත, ග්‍රාම සංවර්ධන,
ආර්ථික ප්‍රවර්ධන, සමාජ සුභසාධන, පරිවාස හා
ළමාරක්ෂක සේවා, වනිතා කටයුතු, නිවාස හා
ඉදිකිරීම් සහ මිනිස්බල හා රැකී රක්ෂා අමාත්‍යාංශය,
අංක 147, කොළඹ පාර,
කළුවැල්ල,
ගාල්ල.

06-51

